## 421 රිදී වලා ගැබින් නැගෙන

රිදී වලා ගැබින් නැගෙන කුමරි කව්රුදෝ
අඹරෙ දිනිඳු වනසෙ දිලෙන මුහුණ කාගෙදෝ
කුළුණු බරින් කඳුළු සැලෙන දෙනෙත කාගෙදෝ
කොමල මුවින් මා සනසන රැජිණ කව්රුදෝ

දේව දිතිති ඒ දෙව් කුමරිය ඒ
සමිඳු දාසි ඒ සගයේ රැජිණ ඒ
මල් කුමාරි ඒ හෙළ රැජිණිය ඒ
දේව මෑණි ඒ අපේ අම්මා ඒ

මිසර දෙසට කුමරු රැගෙන ගියේ කව්රුදෝ
කුරිරු රජුගේ අතින් ජේසු මිදුවේ කව්රුදෝ
මෙහෙළ බිමට අප රකිනට වැඩියේ කව්රුදෝ
කියනු කියනු හෙළ වැසියෙනි එතුම් කව්රුදෝ